සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

## තෙවන වාර පරීක්ෂණය - 8 ශ්‍රේණිය - 2019

## Third Term Test - Grade 8 - 2019

නම : ........................................... පෙරදිග සංගීතය කාලය : පැය 02 යි.

වැදගත් :

- සියලුම ප්‍රශ්නවලට වඩාත් නිවැරදි පිළිතුරු සපයන්න.

## I කොටස

- 1 සිට 10 දක්වා ප්‍රශ්න සඳහා වඩාත් ගැළපෙන පිළිතුර යටින් ඉරක් අඳින්න.

(1) පද මාලාව ගායනය කළ යුතු ආකාරය දක්වෙනුයේ,
1. පෙරවාදනය 2. කවුන්ටර් 3. තනුව 4. ස්ථායි

(2) ජබ් තාලයේ බලියට අයත් විභාගයේ ඨේකා අක්ෂර වනුයේ,
1. ති නා 2. ත තිත් 3. ධා ති තිත් 4. ධි නා

(3) බෙංගාල ප්‍රදේශයේ ප්‍රචලිත ප්‍රධාන ගායන ශෛලියකි.
1. භජන් ගී 2. කිතු බැති ගී 3. රවීන්ද්‍ර ගී 4. ගසල් ගී

(4) සිනහවෙන් හෝ කතාවෙන් බෑ මතින්නට මිනිසා යන ගීතයේ තාල ගති ලක්ෂණ අනුව වඩාත් සුදුසු තිත වනුයේ
1. සුළු මැදුම් දෙතිත 2. මැදුම් මහා දෙතිත 3. මහා තනි තිත 4. මහා මැදුම් දෙතිත

(5) සත් සියක් කපු මල් යන ගීතය
1. නූර්ති ගීතයකි 2. බැති ගීතයකි 3. නව නාට්‍ය ගීතයකි 4. නාඩගම් ගීයකි

(6) නාඩගම් සම්ප්‍රදායේ ප්‍රධාන තාල වාද්‍ය භාණ්ඩය වනුයේ,
1. මෘදංගය යි 2. මද්දලය යි 3. ඩොල්කිය යි 4. මුම්මැඩිය යි

(7) quaver (ක්වේවර්) ස්වර සංකේතයේ මාත්‍රාවක වටිනාකම වනුයේ,
1. හතරකි 2. දෙකකි 3. එකකි 4. භාගයකි

(8) ස - රි/ ග - ම / ග ම ප - යනුවෙන් ඇරඹෙන ස්වර පාදය කිනම් රාගයකට අයත් ද?
1. කාෆි රාගය 2. බිලාවල් රාගය 3. භූපාලි රාගය 4. යමන් රාගය

(9) අමීර් ඛුෂ්රු සංගීතවේදියා විසින් නිර්මාණය කල තත් සංගීත වාද්‍ය භාණ්ඩය වනුයේ,
1. ගිටාරය 2. සිතාරය 3. බටනලාව 4. තබ්ලාව

(10) කෙහෙර්වා තාලයේ ආවර්ථ දෙකකදී ලැබෙන මාත්‍රා සංඛ්‍යාව තවත් තාලයක ඨේකාවේ මාත්‍රා ගණනට සමානය. එම තාලය කුමක් ද?
1. ජබ් තාලය 2. දාදරා තාලය 3. දීප්චන්දි තාලය 4. ත්‍රිතාලය

I  **ප්‍රශ්න අංක 11 සිට 15 දක්වා ප්‍රශ්නවලට ගැළපෙන පිළිතුර වරහන් තුළින් තෝරා ලියන්න.**
(සෙම්බ්‍රිව්, හජන් ගී, මැදුම් මහ දෙතිත, මිනිම්, රවීන්ද්‍ර ගී, ස්ථායි, සුළු මැදුම් දෙතිත, පියගුණ ගී, අතුරුවාදනය, මව්ගුණ ගී)

(11) දෙවියන්ගේ ගුණ වර්ණනා කරනු ලබන්නේ ........................................................................................ වලිනි.

(12) බටහිර ස්වර ප්‍රස්තාරකරණයේ මාත්‍රා හතරක වටිනාකම දක්වන ස්වර සංකේතය .............................................................. වේ.

(13) දීප්චන්දි තාලයට සමාන දේශීය තිත වන්නේ ........................................................................................ යි.

(14) ගීතයේ මුල් කොටස හා දෙවන කොටස සම්බන්ධ කරනුයේ .................................................... මගිනි.

(15) සොම්නස හෝ සන්තාපය යන ගීතය ........................................................................................ ගණයට අයත් වේ.

I  **16 සිට 20 දක්වා ප්‍රශ්නවලට පිළිතුර හරි නම් (4) ලකුණ ද වැරදි නම් (7) ලකුණ ද යොදන්න.**

(16) මද්දලය වාද්‍ය භාණ්ඩයෙන් ධා ධිං ධා නා යන අක්ෂර වාදනය කරයි. (    )

(17) මීරා බායි තුල්සිදාස් යන නම සඳහන් වන්නේ භජන් ගායන ශෛලියේය. (    )

(18) මුඛ පරම්පරාවෙන් පැවතගෙන ඒම ගැමි ගීයේ ලක්ෂණයක් නොවේ. (    )

(19) ජබ් තාලය හා දීප්චන්දි තාලයේ මාත්‍රා සංඛ්‍යාව පිළිවෙලින් 14 හා 10 වේ. (    )

(20) දෙවන් පහන් මිනි නගා යන ගීතය කිතුනු බැති ගීයකි. (    )

## II කොටස

I පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න තුනකට පමණක් පිළිතුරු සපයන්න.

01. (i) ඔබ උගත් කාෆි රාගාශ්‍රිත ස්වර ස්ථාපන ගීතයක ස්ථායි කොටස ගීත ස්වර ප්‍රස්තාර කරන්න. (ලකුණු 06)
 (ii) කාෆි රාගයේ විවාදීව යෙදෙන ස්වර මොනවා ද? (ලකුණු 02)
 (iii) එම රාගයට අයත් ස්වර භාවිත කරමින් සරල ස්වර අභ්‍යාසයක් ගොඩනගන්න. (ලකුණු 02)

02.

| | | | |
|---|---|---|---|
| (i) | මද්දල් දෙකක් යොදා ගනී | (ii) | කර්ණාටක සංගීතය |
| (iii) | (iv) | **ශ්‍රී වික්‍රම විදුර** | (v) |

 (i) රංග සම්ප්‍රදායන් දෙකක් ඇසුරෙන් දී ඇති ඉහත වගුව නිවැරදිව සම්පූර්ණ කරන්න. (ලකුණු 5)
 (ii) ඉන් එක් වර්ගයකට අයත් ගීතයක් නිවැරදිව සම්පූර්ණයෙන් ලියන්න. (ලකුණු 5)

03. පහත සඳහන් කරුණුවලට අදාළ හින්දුස්ථානි තාල හඳුනා ගන්න.
 A විභාග 4කි මාත්‍රා 16කි
 B විභාග 4කි මාත්‍රා 10කි
 C විභාග 4කි මාත්‍රා 14කි
 D විභාග 2කි මාත්‍රා 6කි

 (i) හින්දුස්ථානි තාල පිළිවෙලින් නම් කරන්න. (ලකුණු 4)
 (ii) B තාලයට අදාළ දේශීය තිත නම්කර ප්‍රස්තාර කරන්න. (ලකුණු 4)
 (iii) 'නිල් අහස් තලේ අගේ' යන ගීතයට ගැළපෙන හින්දුස්ථානි තාලය කුමක් ද? (ලකුණු 2)

04. ඔබ උගත් ගායන ශෛලින් දෙකක තොරතුරු පහත දැක්වේ.
 a වංග බසින් රචනා වී ඇත
 b උත්තර භාරතයේ ප්‍රචලිතය
 c දෙවියන්ගේ ගුණ ගයයි
 d එස්රාජය හා කෝල් නමැති තාල වාද්‍ය භාණ්ඩය යොදා ගනී
 e හින්දි බසින් රචනා වී ඇත.
 f හින්දුස්ථානි තාල, රාග පදනම් වී ඇත
 g සරල තාල සහ ගැමි සංගීතය යොදාගෙන ඇත
 h රවින්ද්‍රනාත් තාගෝර් තුමා විසින් නිර්මාණය කර ඇත
 (i) මෙම ගායන ශෛලීන් දෙක නම් කරන්න. (ලකුණු 2)
 (ii) නම් කල ගායන ශෛලීන් දෙකට අදාළ වන කරුණු නිවැරදිව වෙන වෙනම ලියා දක්වන්න. (ලකුණු 6)
 (iii) ඔබ නම් කරන ලද එක් ගායන ශෛලියකට අදාළ මුල් ගී පාදය ලියා දක්වන්න. (ලකුණු 2)

05. (i) සදැස්මත් හා ගීමත් අතර වෙනස කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 4)
 (ii) ''බුද්ධං සරණේ සිරස දරාගෙන'' මෙම කවි පාදයේ ගීමත් හා සදැස්මත් ගණන වෙන් වෙන්ව ලියා දක්වන්න. (ලකුණු 3)
 (iii) ලඝු ගුරු ප්ලුත මාත්‍රාවලට හිමි වටිනාකම් සංකේත උදාහරණ සහිතව ලියන්න. (ලකුණු 3)

සියලුම හිමිකම් ඇව්රිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

## තෙවන වාර පරීක්ෂණය - 8 ශ්‍රේණිය - 2019
## Third Term Test - Grade 8 - 2019

### පෙරදිග සංගීතය - ප්‍රායෝගික පරීක්ෂණය

01. බිලාවල්, භූපාලි, කාෆි යන රාග ආශ්‍රිත ස්වර ස්ථාපන ගීතවලින් එකකට අයත් ගීයක් ගායනය හෝ වාදනය කරන්න. (ලකුණු 10)

02. භජන්, නූර්ති, නාඩගම් මව්පිය ගුණවරුණ යන වර්ග අතරින් එක් ගීයක් ගායනය හෝ වාදනය කරන්න. (ලකුණු 10)

03. ත්‍රිතාල්, ධාදරා, දීප්චන්දි, ඣප් යන තාලවලින් එක් තාලයක් අතින් තාල දමන්න. (ලකුණු 10)

04. නෙළුම් ගී කමත් ගී යන ගීත වර්ග දෙකෙන් එක් ගීයක් ගායනය කරන්න. ඊට අදාළ තිත නම් කරන්න. (ලකුණු 10)

05. ඔබ උගත් ස්වර ස්ථාපන ගීයක් ස්වර පුවරුවෙන් හා ඔබ භාවිත කරන සංගීත භාණ්ඩයෙන් වාදනය කරන්න. (ලකුණු 10)

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

Answer

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education

## තෙවන වාර පරීක්ෂණය - 8 ශ්‍රේණිය - 2019
## Third Term Test - Grade 8 - 2019

### පෙරදිග සංගීතය - පිළිතුරු පත්‍රය

### I කොටස

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| (1) | 3 | (2) | 1 | (3) | 3 | (4) | 2 |
| (5) | 3 | (6) | 2 | (7) | 4 | (8) | 1 |
| (9) | 2 | (10) | 4 | (11) | භජන් | (12) | සෙමිබ්‍රීව් |
| (13) | මැදුම් මහ දෙතිත | (14) | අතුරු වාදනය | (15) | මව් ගුණ ගී | (16) | වැරදි |
| (17) | හරි | (18) | වැරදි | (19) | වැරදි | (20) | හරි |

(ලකුණු 20)

### II කොටස

01. (i) හෝ හෝ ගා / සිරිසාර අතිශාන්ත යන ගීත දෙකෙන් එකක් ප්‍රස්තාර කර ඇත්නම් සම්පූර්ණ ලකුණු ලබා දෙන්න. (ලකුණු 6)
(ii) ශුද්ධ ගාන්ධාරය හා ශුද්ධ නිශාධය (ලකුණු 2)
(iii) නිවැරදි තාවය අනුව අදාළ ලකුණු ලබා දෙන්න. (ලකුණු 2)

02. (i) 1. නාඩගම් 2. බැලසන්ත/බ්‍රම්පොට් /ඉයුජින් 3. නූර්ති 4. තබ්ලාව 5. හින්දුස්ථානි සංගීතය
(කොටසකට ලකුණු එක බැගින් නිවැරදි නම් ලබා දෙන්න.) (ලකුණු 5)
(ii) නිවැරදිතාවය අනුව අදාළ ලකුණු ලබා දෙන්න. (ලකුණු 5)

03. (i) A ත්‍රිතාල් B ජප් තාල් C දීප්චන්දි D ධාදරා (ලකුණු 4)
(ii) සුළු මැදුම් දෙතිත නිවැරදිව ප්‍රස්තාර කොට ඇත්නම් අදාළ ලකුණු ලබාදෙන්න. (ලකුණු 4)
(iii) ධාදරා තාලය (ලකුණු 2)

04. (i) භජන් ගීත රබීන්ද්‍ර ගීත (ලකුණු 2)
(ii)

| භජන් ගීත | රබීන්ද්‍ර ගීත |
|---|---|
| b c e f | a d g h |

(ලකුණු 6)

(iii) ගී පාදය ලිවීමට (ලකුණු 2)

05. (i) සදැස්මත් ගීමත් සරලව විස්තර කිරීමට (ලකුණු 4)
(ii) සදැස්මත් 16
ගීමත් 24 (ලකුණු 3)
(iii) 
= 01
= 02
= 03 (ලකුණු 3)